**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

PEOPLE'S INSURANCE
EMPOWERING A RESILIENT NATION

# ගිනි රක්ෂණ ඔප්පුව - රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය

ඔප්පු වර්ගය: ගිනි රක්ෂණ ඔප්පුව

ලබා දෙනු ලබන මූලික ආවරණය:

උපලේඛනයේ විස්තර කර ඇති පරිදි රක්ෂිත දේපළ හෝ එහි කිසියම් කොටසක් ගින්නෙන් හෝ අකුණුසැර වැදී හෝ ඔප්පු උපලේඛනයේ සඳහන් කර ඇති වෙනත් උපද්‍රවයකින් විනාශයට පත්වුවහොත් හෝ හානියට පත්වුවහොත් ඊට අනුකූලව ආවරණය අදාළ වනු ඇත.

*(මූලික ආවරණය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 බලන්න)*

අමතර ආවරණ (අමතර වාරිකයක් ගෙවා මෙම අමතර ආවරණය ලබා ගත හැකිය):

1. වැඩවර්ජන, කැරළි කෝලාහල සහ මහජන කැළඹීම්
2. ත්‍රස්තවාදය
3. පිපිරීම්
4. ඝට්ටනය
5. ගුවන් යානා හානි (උඩ්‍යාමය හානි)
6. සැඩ සුලං සහ චණ්ඩමාරුත - සුළි සුලං, ටයිෆූන්, හරිකේන්, ටෝනාඩෝ
7. ජලගැලීම්
8. ජල ටැංකි, උපකරණ හෝ නළ පිපිරීම් සහ පිටාර ගැලීම්
9. භූමිකම්පා සහ ගිනිකඳු පිපිරීම්
10. ස්වයං ගිනිගැනීම්
11. විදුලි උපකරණවලට සහ ස්ථාපනයකිරීම් වලට විදුලිමය ගින්නෙන් සහ අකුණුසැර වැදී සිදුවන හානි
12. ඔබගේ ඔප්පුවෙහි විස්තර කර ඇති පරිදි වෙනත් අමතර ආවරණ

*(ඔප්පුවෙහි පිටු අංක 08 සිට 15 දක්වා සඳහන් දීර්ඝකිරීම්, වගන්ති සහ ප්‍රතිඥාහාර යන ශීර්ෂය යටතේ ''දීර්ඝකිරීම්'' බලන්න)*

ප්‍රධාන ලක්ෂණය(යන්):

උපද්‍රව පදනම් කරගත් ඔප්පුව, ඔප්පු උපලේඛනයේ ලැයිස්තු කර ඇති උපද්‍රව මගින් රක්ෂිත දේපළට සිදුවන අලාභ හෝ හානි පහත ලැයිස්තු කර ඇති ව්‍යතිරේකවලට යටත්ව ආවරණය කරයි:

ආවරණය නොවන දේ (ව්‍යතිරේක):

1. ගිනි ගනිමින් තිබියදී හෝ ගින්නෙන් පසුව සිදුවූ සොරකම් නිසා ඇතිවූ අලාභය
2. මෙහි 7(ඊ) යටතේ සලසා ඇත්නම් මිස, ස්වයං පැසවීම, ස්වභාවික රත්වීම හෝ ස්වයං දහනය හේතුවෙන් හෝ රත් කිරීමේ හෝ වියලීමේ ක්‍රියාවලියකට භාජනය වීමෙන් දේපලවලට සිදුවන අලාභ හෝ හානි
3. පහත සඳහන් කරුණු මගින් හෝ ඒ හරහා හෝ එහි අනශංගයක් වශයෙන් සිදුවූ අලාභ හෝ හානි:

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



i. රාජ්‍ය බලධාරීන්ගේ නියමය පරිදි දේපළ ගිනි තැබීම්
ii. භූගත ගින්න

4. අ) ඕනෑම න්‍යෂ්ටික ඉන්ධනයකින් හෝ ඕනෑම න්‍යෂ්ටික ස්ථාපනයකින් ප්‍රතික්‍රියාකාරකයකින් හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමකින් හෝ න්‍යෂ්ටික ඉන්ධනයකින් ඇතිවන විකිරිණශීලීතා අයනීකරණය හෝ දූෂණය වීම

ආ) ඕනෑම න්‍යෂ්ටික ස්ථාපනයක, ප්‍රතික්‍රියාකාරකයකින් හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමක හෝ එහි න්‍යෂ්ටික සංරචකයක විකිරණශීලී, විෂ සහිත පපුරණ ද්‍රව්‍ය හෝ වෙනත් අන්තරායකර හෝ දූෂිත අන්තර්ගතය

ඇ) පරමාණුක හෝ න්‍යෂ්ටික විකණ්ඩනය සහ/හෝ විලයනය හෝ ඒ හා සමාන ප්‍රතික්‍රියාවක් හෝ විකිරණශීලී බලයක් හෝ පදාර්ථයක් භාවිතා කරන ඕනෑම යුද අවියක්

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02, "ආවරණය කර නොමැති අවදානම්" යන කොටස යටතේ කරුණු අංක 5 බලන්න*

<u>ආවරණය නොවන සිදුවීම්:</u>

1. භූමිකම්පාව, ගිනිකඳු පිපිරීම හෝ ස්වභාව ධර්මයේ වෙනත් කම්පනයන් (අමතර ආවරණ වශයෙන් ලබාගෙන නොමැති නම්)
2. ටයිෆූන්, හරිකේන්, ටෝනාඩෝ, සුළි සුළං, කුණාටු චණ්ඩමාරුත හෝ වෙනත් වායුගෝලීය කැළඹීම් (අමතර ආවරණ වශයෙන් ලබාගෙන නොමැති නම්)
3. යුද්ධය
4. කැරළි කෝලාහල, වැඩවර්ජන, මහජන කැළඹීම් සහ ත්‍රස්තවාදය (අමතර ආවරණ වශයෙන් ලබාගෙන නොමැති නම්)

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02 සහ 03, "ආවරණය කර නොමැති සිද්ධීන්" යන කොටස යටතේ කරුණු අංක 6.1 බලන්න*

<u>ආවරණය නොවන වගකීම්:</u>

පහත සඳහන් හේතූන් නිසා සිදුවන දේපල විනාශය හෝ හානිය හැර (අන් අයුරකින් බැහැර කර නොමැති නම්) දූෂ්‍ය වීම හෝ අපවිත්‍ර වීම හේතුවෙන් සිදුවන විනාශය සහ හානි පිළිබඳ කිසිදු වගකීමක් මෙම රක්ෂණයෙන් ආවරණය නොවේ:

(i) මෙහි රක්ෂිත හදිසි සිදුවීමක් නිසා සිදුවන දූෂණය වීම හෝ අපවිත්‍ර වීම
(ii) දූෂණය වීම හෝ අපවිත්‍ර වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙහි රක්ෂිත හදිසි සිදුවීමක් පැන නැගීම

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "ආවරණය කර නොමැති වගකීම්" යන කොටස යටතේ කරුණු අංක 6.2 බලන්න*

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

PEOPLE'S INSURANCE
EMPOWERING A RESILIENT NATION

ප්‍රකාශිතව ඇතුලත් කර ඇත්නම් මිස, ආවරණය නොවන අවදානම්:

1. භාරයේ හෝ කොමිස් මත ගබා ගන්නා භාණ්ඩ
2. රත්තරන් හෝ නොඑබ්බවූ වටිනා ගල්
3. කෞතුක වස්තු හෝ කලා නිර්මාණ
4. අත් පිටපත්, පිඹුරුපත්, චිත්‍ර, සැලසුම්, මෝස්තර, ආකෘති හෝ අච්චු
5. සුරැකුම්පත්, බැඳුම්කර හෝ ඕනෑම ආකාරයක ලියවිලි, මුද්දර, කාසි හෝ මුදල් නෝට්ටු, චෙක්පත් ගිණුම් වාර්තා හෝ වෙනත් ව්‍යාපාරික පොත්පත්, පරිගණක ජාලයන්
6. ගල් අඟුරු, ස්වයං දහනය නිසා සිදුවන අලාභ හෝ හානි
7. පුපුරණ ද්‍රව්‍ය
8. පිපිරීමක් නිසා, පිපිරීමක් හරහා හෝ පිපිරීමක ප්‍රතිවිපාක වශයෙන් සිදුවන ඕනෑම අලාභයක් හෝ හානියක්. එහෙත් ගෑස් උත්පාදනය නොකරන සහ ගෑස් කර්මාන්ත ශාලාවක කොටසක් නොවන ගොඩනැගිල්ලක ආලෝකමත් කරනු සඳහා හෝ ගෘහමය කටයුතු සඳහා භාවිතා කරන ගෑස් පිපිරීම මෙම ඔප්පුව යටතේ ගින්නෙන් සිදුවන අලාභයක් ලෙස සැලකේ.
9. අහඹුවකින් හෝ වෙනත් අයුරකින් වනාන්තර, ලඳු කැලෑ, තෘණ කැලෑ ගිනි තැබීම් හෝ ගින්න මගින් ඉඩම් හෙළි කිරීම හේතුවෙන් ඒ හරහා හෝ එහි ප්‍රතිවිපාක වශයෙන් සිදුවන අලාභ හෝ හානි
10. විදුලිමය හානි බැහැර කිරීමේ වගන්තිය (මෙම ඔප්පුව යටතේ රක්ෂිත විදුලිමය යන්ත්‍ර, උපකරණ සහ සවිකිරීම් සඳහා යෙදේ)

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "ප්‍රකාශිතව ඇතුලත් කර ඇත්නම් මිස, ආවරණය කර නොමැති අවදානම්" යන කොටස යටතේ කරුණු අංක 7 බලන්න*

වගන්ති:
*ඔබගේ ඔප්පු උපලේඛනයෙහි සඳහන් කර ඇති වගන්ති පමණක් ඔබගේ ඔප්පුවට අදාළ වේ. කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 15 සිට 19 දක්වා "දීර්ඝකිරීම්, වගන්ති සහ ප්‍රතිඥාහාර" යන ශීර්ෂය යටතේ සඳහන් "වගන්ති" බලන්න)*

ප්‍රතිඥාහාර:
*ඔබගේ ඔප්පු උපලේඛනයෙහි සඳහන් කර ඇති "ප්‍රතිඥාහාරය" පමණක් ඔබගේ ඔප්පුවට අදාළ වේ. කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 19 සහ 20 හි "දීර්ඝකිරීම්, වගන්ති සහ ප්‍රතිඥාහාර" යන ශීර්ෂය යටතේ සඳහන් "ප්‍රතිඥාහාරය" බලන්න)*

<u>හිමිකම් ක්‍රියා පටිපාටිය සහ අවශ්‍ය ලියකියවිලි:</u>

මෙම ඔප්පුව යටතේ හිමිකම් පෑමකට තුඩු දිය හැකි ඕනෑම සිදුවීමක් පිළිබඳව රක්ෂණ සමාගමට වහාම දැනුම් දිය යුතුය. එවන් ඕනෑම සිද්ධියක් ඇති වී දින පහළොවක් (15) ඇතුලත හෝ සමාගම විසින් ලිඛිතව අනුමත කර ඇති අමතර කාලසීමාව ඇතුලත නිසි ලෙස සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමයක් සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

1. අලාභය/හානි පිළිබඳව ඔබ දැනගත් වහාම 011-2206306 යන අංකය ඔස්සේ අපට දන්වන්න.

2. නීතියෙන් නියම කර ඇති පරිදි ලඟම ඇති පොලිස් ස්ථානයට සිද්ධිය වාර්තා කරන්න (සොරකමක්, ද්වේෂසහගත හානියක්, කැරළි සහ වැඩවර්ජන, ගිනි තැබීමක් හෝ සැකසහිත ගිනි තැබීමක් සම්බන්ධයෙන්).
3. තෙවැනි පාර්ශවයක් විසින් හිමිකම් පෑමක් ඉදිරිපත් කර තිබුණහොත් කිසිම පොරොන්දුවක් ලබා නොදී එය අප වෙත යොමු කරන්න.
4. ඔබගේ හිමිකම තක්සේරු කිරීමේ ක්‍රියාවලිය හැකි තරම් වේගවත් කිරීම සඳහා මෝටර්-නොවන හිමිකම් දෙපාර්තමේන්තුව විසින් යවනු ලබන හිමිකම් පෝරමය පුරවා ඉල්ලා ඇති අනෙකුත් ලිපිලේඛන සමග අප වෙත එවන්න.
5. දේපල හිමිකම් පෑමක් සම්බන්ධයෙන්, අවදානම පිහිටි ස්ථානය නිරීක්ෂණය කිරීම සඳහා තක්සේරුකරුවකු, විමර්ශකයකු හැකි ඉක්මනින් යවනු ලැබේ.
6. අලාභය/හානි තක්සේරු කිරීම අලාභයේ ස්වභාවය මත පදනම්ව - ගොඩනැගිල්ල/තොග/යන්ත්‍රසූත්‍ර වැනි - සුදුසු අලාභ තක්සේරුකරුවකු විසින් සිදු කරනු ලැබේ.
7. අවශ්‍ය සියලු විස්තර ලැබීමෙන් පසුව හිමිකම් පියවීමේ කාලය දින 03 ක් ඇතුලත වේ.
8. අවශ්‍ය ලියකියවිලි,
   - නිසි පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෝරමය
   - අදාල වන්නේ නම්, පොලීසියට කරන ලද පැමිණිල්ලෙහි පිටපතක්
   - හිමිකම සැකසීමේදී සමාගමට අවශ්‍ය විය හැකි වෙනත් අවශ්‍යතාවන්

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 4, "කොන්දේසි" යන කොටස යටතේ කරුණු අංක 11 බලන්න*

වංචාව:
රක්ෂිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන කිසියම් හිමිකම් පෑමක් කිසියම් ආකාරයකින් පදනම් විරහිත, වංචනික හෝ හිතාමතාම අතිශයෝක්තියෙන් දක්වා ඇත්නම්, හෝ එයට සාධක වශයෙන් ව්‍යාජ ප්‍රකාශ කර ඇත්නම්, මේ යටතේ කිසිදු හිමිකම් පෑමක් ගෙවනු නොලැබේ.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 05, "කොන්දේසි" යන කොටස යටතේ කරුණු අංක 14 අහිමි වීම බලන්න*

<u>ඔප්පු හිමියාගේ වගකීම්:</u>

වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව ඔප්පු හිමියාගේ වගකීම්

- මිලදී ගන්නා අවස්ථාවේදී:- ඕනෑම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමක් වළක්වා ගැනීම සඳහා යෝජනා පත්‍රයේ ඉල්ලා ඇති සියලුම වැදගත් කරුණු සත්‍ය හා නිවැරදිව හෙළි කරන්න.

- ඔප්පු කාලසීමාවේදී:- අවදානම් හෝ පුද්ගලික තොරතුරුවල සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව රක්ෂණ සමාගමට දැනුම් දෙන්න.

  *කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01, "කොන්දේසි" යන කොටස යටතේ කරුණු අංක 01 බලන්න*

හිමිකම් පෑමක් කරන විට ඔප්පු හිමියාගේ වගකීම්

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

- හිමිකම් පෑමක් කරන විට:- හිමිකම් පෝරමය සමග හිමිකම් ක්‍රියා පටිපාටියේ සඳහන් කර ඇති පරිදි අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න.

  *කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04 සහ 05, "කොන්දේසි" යන කොටස යටතේ කරුණු අංක 11 සහ 13 බලන්න*

- වාරික ගෙවීම:- ඔප්පුවේ වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරයට අනුව විය යුතුය.

  *කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 07, "කොන්දේසි" යන කොටස යටතේ කරුණු අංක 25 වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරය බලන්න*

<u>පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය:-</u>

අපි ඔබට සේවය කිරීමට කැපවී සිටින අතර ඔබගේ අදහස්/යෝජනා ලබාගැනීමට කැමැත්තෙන් සිටින්නෙමු. අපගේ සේවාවන් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය:

- දුරකථනයෙන් - පාරිභෝගික සේවා නිලධාරි - 011 2126136
- ඊ-මේල් හරහා - pilassist@peoplesinsurance.lk
- වට්ස්ඇප් හරහා - 0716230048
- ෆැක්ස් මගින් - 011 2126109
- තැපෑලෙන් - පාරිභෝගික සේවා නිලධාරි, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05
- මාර්ගගත ක්‍රමය හරහා - පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය අපගේ වෙබ් අඩවියෙන් www.peoplesinsurance.lk ලබාගත හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න
- අප කාර්යාලය වෙත පැමිණීමෙන්

පැමිණිල්ලක ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත සඳහන් තොරතුරු ලබා දිය යුතුය:-

i. පැමිණිල්ල කෙටියෙන්
ii. ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධ විය හැකි තොරතුරු
iii. යොමුව: ඔප්පු අංකය / වාහන අංකය / හිමිකම් අංකය
iv. සනාථ කෙරෙන ඕනෑම ලියවිලි

පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ www.peoplesinsurance.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න

<u>ආරවුල් විසඳීම:-</u>

ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක සඳහා අප විසින් ලබා දී ඇති විසඳුම පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, පහත සඳහන් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් (ADR) භාවිතා කිරීමට ඔබට හැකියාවක් ඇත:

i. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්
අංක 01, බෙතෙස්ඩා පෙදෙස,කොළඹ 05
info@insuranceombudsman.lk
011 2505542 / 011 250 5041

ii. බේරුම්කරණය:- ඔප්පුවේ බේරුම්කරණ වගන්තියට අනුව

iii. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

අධ්‍යක්ෂ විමර්ශන
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වෙනි මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01
011 2396184-9 / 011 2335167
investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 21, "පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය" යන කොටස බලන්න*

<u>මතක තබා ගත යුතු කරුණු කිහිපයක්</u>

රක්ෂණය අවලංගු කිරීම:

රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි මෙම රක්ෂණය ඕනෑම අවස්ථාවක අවසන් කළ හැකි අතර, එවැනි අවස්ථාවකදී කිසිදු හිමිකම් පෑමක් කර නොතිබීමට යටත්ව, රක්ෂණ සමාගම විසින් ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලය සඳහා සාමාන්‍ය කෙටි කාලීන අනුපාතයක් රඳවා ගනු ඇත. රක්ෂිතයාට දැනුම් දීමෙන් පසු රක්ෂණ සමාගමේ කැමැත්ත පරිදි ඕනෑම අවස්ථාවක මෙම රක්ෂණය අවලංගු කළ හැකි අතර, එවැනි අවස්ථාවකදී අවලංගු කිරීමේ දින සිට කල් ඉකුත් නොවූ කාලය සඳහා ඉල්ලා සිටි විට වාරිකයෙන් සමානුපාතික කොටසක් ආපසු ගෙවීමට රක්ෂණ සමාගම බැඳී සිටී.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04, "කොන්දේසි" යන කොටස යටතේ කරුණු අංක 10 බලන්න*

මෙම ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි නිසි ලෙස පිළිපැදීම සහ ඉටු කිරීම, මෙම ඔප්පුව යටතේ ඕනෑම ගෙවීමක් කිරීමේ රක්ෂණ සමාගමෙහි වගකීමට පූර්ව කොන්දේසියක් වනු ඇත.

<u>වැදගත් සටහන්:</u>

රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID) හි අරමුණ වන්නේ මූලික ආවරණය සහ අමතර ආවරණවල (අදාළ වේ නම්) සහ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් ලබා දීම වන අතර එය ඔබගේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවන් සඳහා සකස් කරන ලද්දක් නොවන බව

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

සලකන්න. මෙම රක්ෂණයට අදාළ ඕනෑම ආකාරයක සියලු කාරණා (හිමිකම් පෑම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ අර්ථකථන සහ නීතිමය කටයුතු වැනි එහෙත් ඒවාට පමණක් සීමා නොවූ) මෙම ලේඛනයෙහි අන්තර්ගතය අභිබවා බලපැවැත්වෙන මූලික රක්ෂණ ඔප්පුවේ ඉංග්‍රීසි මුද්‍රණයේ නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේක මගින් පාලනය වන බව කරුණාවෙන් සලකන්න.

වැඩිදුර තොරතුරු සඳහා:

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පහත සඳහන් මාර්ග ඔස්සේ එය ලබා ගත හැකිය:

- දුරකථනය - 0112126126
- ඊ-මේල් - pilassist@peoplesinsurance.lk
- දිවයින පුරා පිහිටි අපගේ ශාඛා කාර්යාලයක් වෙත පැමිණීමෙන්